මංජුල වෙත්තසිංහ

හීනමානය යනු කුමක්දැයි මම මගේ පස්වෙනි පාසල් වසරේදී සිංහල භාර ගුරුතුමාගෙන් දැනගත් දිනය අද මෙන් මතකය. ඊට පෙරින් මා සිතා සිටියේ හීනමානය යනු "අඩුවෙන් අහංකාරය වීම" ලෙසය. "හීන" යන වචනයේ ඍජු අර්ථය භාවිතා කර මගේ පුංචි සිතෙන් එසේ නිගමනය කරන්නට ඇත. එහි නියම අර්ථය සහමුලින්ම වෙනස් එනම් "තමන් ගැන අඩු හෝ පහත් ලෙස සැලකීම" වුවත්, වයස අවුරුදු දහයක් වැනි පැඟිරි වියේදී "නොදන්නා" සිංහල වචනයක අරුත ඊට අදාල "දන්නා වචන" වල අරුත් හරහා තර්කානුකූලව අවබෝධ කර ගැනීමට එදා පුංචි මට තිබූ චිත්ත ධෛර්යය ගැන නම් මම ආඩම්බර




වෙමි.

ඊටම සමාන මහත් විනෝදාත්මක වචන හරඹයක් මීට වසර අටකට පමණ පෙර මගේ දරුවන්ගෙන්ද මම අසා ඇත්තෙමි. දරුවන්ගේ ඉරිදා සිංහල පාසල හමාර වී දුවත්, පුතාත් සමග නිවස කරා පැමිණෙන අතරමගදී පාසලේදී උගත් සිංහල ගැන ඔවුන් සමග කතා බහ කරමින් යාම මගේ සිරිතක් වී තිබුණි. වරක් මම ඔවුන්ගේ සිංහලෙන් ගණන් කිරීමේ හැකියාව මැන බැලීම සඳහා එකේ සිට ඉහලට සිංහලෙන් ගණන කර පෙන්වන ලෙස ඉල්ලා සිටියෙමි. සාර්ථකව "එක - දෙක -තුන......" ලෙස තරගයට මෙන් ගැනගෙන ගිය ඔවුන් දෙදෙනා "එකොළහ" ට පසු මඳක් නැවතී ඊලගට කීවේ "දෙකොළහ" කියාය. තර්කානුකූලව එය ඔවුන්ට නිවැරදිය. මන්ද එක ලගට දෙක නම්, එකොළහට පසු දෙකොළහ විය යුතුය. කෙසේ වෙතත් මහා ආයාසයෙන් එම වචනය දොළහ ලෙස නිවැරදි කෙළෙමි. එතනදී යලිත් හිරවුන ඔවුන්ට ඊලග ඉලක්කම කියා ගත නොහැකි විය. " තු .....ළහ", පුතාගෙන් පුංචි උත්සහයක්. " නෑ....නෑ..... දහතුන", එසේ මා එය නිවැරදි කරද්දී දරු දෙදෙනා මා දෙස බලා සිටියේ අපභ්‍රංශ දොඩවන්නෙකු දෙස බලන්නාක් මෙනි. එහෙත් ඔවුන් එය "තර්කානුකූලව" තේරුම් ගෙන ඇත. මන්ද, යන්ත්‍රයක් මෙන් "දහ හතර - දහ පහ - දහ හය...." ඔවුන් වේගයෙන් ගැනගෙන යත්. ඔවුනුත් පැඟිරි වියේදීම භාෂාව "තර්කානුකූලව" තේරුම්-බේරුම් කරගෙන ඉදිරියට යෑමට සූදානම් බව මට දැනුණි. කෙසේ වෙතත් යලිත් අමාරුවෙන් "දහ පහ" පහළොහ ලෙසත් "දහ හය" දහසය ලෙසත් නිවැරදි කිරීමට සෑහෙන කාලයක් ගතවුනේ මට සිනහව තදකර ගැනීමට අපහසු වූ නිසා බව නම් මතකය.

මට මෙම සිදුවීම මතක් වූයේ දොලොස් වසරක් පුරා අසනීපයකට හැරෙන්න වෙනත් කිසිම " නිදහසට කරුණක්" නොතකා සිඩ්නි නුවර "උතුරු පැරමාටා" හි ඉරිදා සිංහල පාසලට (www.sihhalaschool.org.au) දුවත් පුතාත් රැගෙන ගිය ඒ සුන්දර කාලය පසුගිය දෙසැම්බරයේදී නොදැනීම අවසන් වීමේ සිහින් වේදනාවක් සිරුර පුරා දිය ගිය බව දැනුනු නිසා විය යුතුය. එහෙත් ඉංග්‍රීසි භාෂාව භාවිතා කරන රටක ඉපිද, ඉංග්‍රීසියෙන්ම පාසලේ ඉගෙනගෙන,ඉංග්‍රීසි පොත්පත්, රූපවාහිනී, ගුවන්විදුලිය, ගීත ආදීය සමග හැදුනු වැඩුණු මගේ දරුවන්, සිංහල භාෂාව භාවිතා කරන රටක ඉපිද, සිංහලෙන්ම පාසලේ ඉගෙන ගෙන, සිංහල පොත්පත්, රූපවාහිනී, ගුවන්විදුලිය, ගීත ආදිය සමග හැදී වැඩී වයසින් මුහුකුරා ගිය අංකල්ලා සහ ආන්ටිලා "How are you?" කියා ඉංග්‍රීසියෙන් අසන විට "හොඳයි අංකල්" හෝ "හොඳයි ආන්ටි" කියා සිංහලෙන්ම උත්තර දී ඉහත කී අංකල්ලා ආන්ටිලා කීප විටක්ම තුෂ්නිම්භූත කල අයුරු සිහි වී සිහින් ආඩම්බරයක්ද ඒ පසුපසින්ම සිරුර පුරා දිවගිය බවත් මට දැනුනි.

වසර තුන - හතරක් පමණ ඕස්ට්‍රේලියාවේ ගත කල විගස සිංහල අමතක වී අමුතුම "ඇකසන්ට්" එකකින් සිංහල වචන අමාරුවෙන් වමාරන කළු සුද්දන් දින මට ඔවුන් ගැන ඇති වන්නේ පිළිකුල් බර අනුකම්පාවකි. මන්ද, ඔවුන්ට අල්ලපු අත්තත්, පය ගහපු අත්තත් දෙකම නැති වී, නොදැනීම නියම සුද්දන්ගේ වහළුන් බවට පත්වීඇති නිසාවෙනි. මයිකල් ජැක්සන් මෙන් තම කළු හම සුදු කර ගන්නට තරම් වත්කමක් නැති නිසා, මහත් අකැමැත්තෙන් උපන් කළු සමෙන්ම පෙනී සිටියත්, සිංහලයන් සමග සිංහල උච්චාරණය වෙනස් කර අමාරුවෙන් මෙන් සිංහල වමාරන හෝ එය සම්පූර්ණයෙන්ම අතහැර ඉංරීසියෙන් කතා කරන මේ කළු සුද්දන් පෙලෙනුයේ මම වයස අවුරුදු දහයේදී පමණ තේරුම උගත් "හීනමානය" නැමැති මානසික රෝගයෙනි. ගහට ගිය මිනිහාට මෙන් මොවුන්ටද ඒ සඳහා නිදහසට කරුණු ඇත.

රෝමයේදී රෝමානුවකු ලෙස හැසිරිය යුතු බව යම් කිසිවකු ඈත අතීතයේදී කියා ඇති බව ඔවුන් කියත්.එහෙත් රෝමානුවන් හෝ ජර්මානුනවන් හෝ ඕස්ට්‍රේලියානුවන් හෝ වෙන සුද්දෙකු ශ්‍රී ලංකාවට ගිය විය "ආයුබෝවන්" නොකියන්නේත්, අත සෝදා අතින් කෑම නොකන් නේත්, නොපෙනෙන පැත්තේ සනීපාරක්ෂාව ඇල්වතුරෙන් නොලබා කඩදාසි කෑලිවල අතුල්ලන්නේත්, සාරි-හැට්ට හෝ සරම්-බැනියම් නොඇඳින්නේත්, ශ්‍රී ලංකාවේදී ශ්‍රී ලාංකිකයන් ලෙස හැසිරිය යුතු බව කිසිවෙකුත් කියා නැති නිසා වන්නට ඇත.

අද විදෙස් රටක වෙසෙන මම ශ්‍රී ලංකාවෙන් පිටවූයේ සිංහල භාෂාව නොරුස්සන නිසාවත්, සිංහල සංස්කෘතික ගති ලක්ෂණ නොරුස්සන නිසාවත්, එසේත් නැතිනම් පසුගිය දශක දෙක තුළ අති ජනප්‍රිය නිදහසට කරුණක් වූ "යුද්ධය" නිසාවත් නොවේ. හුදෙක් ආර්ථික ලාභය සඳහාම පමණි. එසේ බැලූ කල මගේත්, අද කාලයේ ලංකාවේ සිට අනවසර බෝට්ටු වලින් මෙරටට පැමිණෙන පුද්ගලයින්ගේත් අතර ලොකු වෙනසක් නැත. එකම වෙනස නම් මම ඇත්ත ඇති සැටියෙන් කීමත්, ඔවුන් ඔවුන්ගේ නිර්ලජ්ජිත බොරු වලින් තම නිරුවත වැසී ඇතැයි විශ්වාස කරගෙන සිටීමත් පමණි. විදෙස් ගතවුණු මට මගේ උපන් රටත්, මව් බසත් කවදත් අමතක නොවුනේ, කිසි දිනෙක මට මගේ මවත්, පියාත් අමතක කල නොහැකි පරිද්දෙනි. ඒ නිසා මම මගේ දරුවන්ටත් මගේ ඒ උරුමය ලබදීම යුතුකමක් ලෙස සැලකුවෙමි. තද පැහැ සම, කළු හිසකෙස්, කළු ඇස් වැනි දෑ අපේ නොමැකිය හැකි ශරීර ලක්ෂණයි. අප යූරෝපීයයන්, ආසියාතිකයින් හෝ අප්‍රිකානුවන් දුටු පමණින් පහසුවෙන් වෙනස්කර හදුනන්නාක් මෙන් ඔවුන්ද අප "ඉන්දියානුවන්" ලෙස පහසුවෙන් හදුනත්. ශ්‍රී ලාංකික, ඉන්දීය, බංගලිදේශ ආදී රටවලින් පැමිණි සියල්ලෝම ඔවුන්ට ඉන්දියානුවෝය.

සත්‍යය සැමවිටම පැණි රස නොවේ. කවුරු කෙසේ කිවත්, මොන තරම් ලෝකයාට පේන්න රගපෑවත්, තමන්ගේ වර්ගයාට වැඩි සැලකිල්ලක්, ආරක්ෂාවක් ලබාදීම මිනිසුන්ට පමණක් නොව මුළු මහත් සත්ව වර්ගයාටම පොදු ස්වාභාවික ලක්ෂණයකි. එය ලබාදී ඇත්තේ ස්වාභාව ධර්මයයි. ස්වාභාව ධර්මයට විරුද්ධ වූ කල පැවැත්මක්ද නැත්තේමය. අතරින් පතර පාවා දෙන්නන් ඒ අතර සිටීමත් ස්වාභාවික දෙයක් වුවත්, එය එතරම් ගහණ නොවන බවත් අපි දනිමු. ඉහත කී හේතුව නිසාම අප කොතරම් සුද්දන් වන්නට උතසාහ කළත් අපත්, අප දරුවනුත් සුද්දන් නොවන වග අපේ උප්පැන්න සහතික නොබලා, අප දෙස බැලූ බැල්මට කීමට මෙලොව ඕනෑම කෙනෙකුට හැකි බව අවබෝධ කර ගැනීමට අති විශාල මොලයක් අවශ්‍ය නොවේ.

අප වෙහෙස වී කඹුරන තාක් පමණක් සුද්දන්ට අප අගේ වන බව අප හොඳින් දැනගත යුතුය. කපන්නට බැරි අත ඉඹිනවා යැයි පැරැන්නන් කීවේ මෙකී සංසිද්ධියටය. වාර්ගික හෝ ජාතිවාදී වෙනස්කම් කිරීම වැලැක්වීම සඳහා තදබල නීති දැමීමට සිදු වී ඇත්තේ ඒ නිසාය. බටහිර සමාජය ඔය සමහරු හිතන තරමටම සර්ව-සධාරණ නම් එකී නීති ඒ සමාජයට අවශ්‍ය නොවන්නේය. එහි ඇති "නොකියවුණු තේරුම" නම් සුද්දා වුනත් තම වර්ගයාට වැඩි සැලකිල්ලකුත් අනෙකුත් වර්ගයනට කුඩම්මාගේ සැලකිල්ලත් දැක්වීම ස්වභාව ධර්මයට අනුකූල ස්වාභාවික දෙයක් බවත්, කෘතිම නීති දමා එය යම් තරමකින් මැඩ පවත්වා ගැනීමට උත්සහ කරන බවත් පමණි.

යම් හෙයකින් අපට ආපසු යන්නට වුවහොත් නොබියව ආපසු යාමට අපට රටක් ඇති බව අපි දනිමු. ශ්‍රී ලංකාව තුළ ආරක්ෂාවක් නැතැයි කියා

> *එනිසා අපේ දරුවන්ට සිංහල උගන්වා, ඔවුන් සමග ගෙදර දොරේදීවත් සිංහලෙන් කථා බස්කර, ඔවුන් මෙලොව විදෙසක තනිවී නොමැති බව පෙන්වා දෙමු. සිංහල පාසලකට යාමෙන් අපේ දරුවන් ඉගෙන ගන්නේ සිංහල භාෂාව පමණක්ම නොවේ.*

කැනඩාව, ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍ය, ඇමරිකාව වැනි රටවල මිනිසුන්ට පට්ටපල් බොරු කියා රවටා දේශපාලන සරණාගතයින් ලෙස පදිංචි වූ ශ්‍රී ලාංකික ද්‍රෝහීන් පවා වසර කිහපයක් යාමටත් පෙරම නිවඩුවටත්, නෑදෑයින් බැලීමටත් එකී " අනාරක්ෂිත" යැයි කියූ ශ්‍රී ලංකාව කරා ලක්ෂ ගණනින් පැමිණීමෙන්ම ඒ බව ඔප්පු වේ.අපට එසේ ආපසු යාමට රටක් ඇතත්, විදෙස්වල ඉපදුනු අපේ දරුවන්ටත් එසේ යාමට රටක් ඇත්දැයි සිතීම අපේ යුතුකමකි. ඒ ඔවුන්ට "සුද්දන්" වීමට කෙසේවත් නොහැකි නිසාවෙනි. එසේ ආපසු යෑම කෙසේ වෙතත්, "නුඹලා අපි නොවේය"

> *වසර දොළහක් පමණ මගේ දරුවන් දෙදෙනා රැගෙන සිංහල පාසල වෙත මා ගිය ගමන මගේ ඒ යුතුකම ඉටුකිරීමට ගත් එක් යෝධ පියවරක් යැයි මට දැන් සිතේ. එය කිසිසේත්ම කාලය නාස්ති කිරීමක් නොවේ. මගේ දරුවන්ට, ලංකාවේ ඉන්නා දරුවන්ට මෙන් ව්‍යක්තව සිංහල කතා කල නොහැකි වුවත්, ඔවුන් තුල " සිංහලකම" කිඳා බැස ඇති බව නම් මට හොඳින් දැනේ. එයම මට විශාල ධනයකි, සතුටකි, ආඩම්බරයකි.*

කියා "ඔවුන්" සිතන බව දැනුනු දිනට මනසින්වත් තනි නොවී සිටීමට හැකි මානසිකත්වයක් දරුවන්ට ලබාදීම අපේ යුතුකමයි. "අපේ මුල සිංහල ජාතියයි මම පිටරටක ඉපදුනු සිංහලයෙක්මි" යන අනන්‍යතාවය අපේ දරුවන්ට දැනුන දාට කිසි දින ඔවුන් මානසිකව අතරමංවීමක් හෝ තනිවීමක් සිදු නොවනු ඇත.

ජාතිවාදී වීම සහ ජාති හිතෛෂී වීම යන දෙක පටලවා නොගෙන සිටීම මෙහිදී වැදගත් වේ. අප සිංහල වීම ගැන ආඩම්බර වන අතර අනෙකුත් ජාතීන් ඔවුන්ගේ ජාතිකත්වයන් ගැන ආඩම්බර වීමත් අප අගය කල යුතුමය. ජාතිවාදීන් වන්නේ තම ජාතියට හැර අනෙකුත් ජාතීන්ට "අසාධාරණ" ලෙස සැලකීමෙන් හෝ පහර දිමෙන් පමණි. තම ජාතිය රැක ගැනීම, ඒ ගැන ආඩම්බර වීම, තම ජාතිය නගා සිටුවීම, ජාතිවාදී වීමක් නොවේ. එය අපේ "සාධාරණ" යුතුකමයි.

අපට "මුදුන් මුලක්" තිබීම අපව මානසිකව ශක්තිමත් කරයි. අප අපේ දරුවන්ටත් මේ මුදුන් මුල ලබා දිය යුතුය. සිංහල සංස්කෘතිය යනු ඒ මුදුන් මුලයි. එය අපටත් අපේ දරුවන්ටත් නොසැලී, නොවැටී සිටීමට උදව් වනු ඇත. අප නැති කලෙක අපේ දරුවන් විදේශයක මනසින් තනි නොවනු ඇත. සිංහල සංස්කෘතය පටන් ගන්නේ සිංහල භාෂාවෙන් මිස ඉංග්‍රීසි හෝ අනෙකුත් භාෂාවකින් නොවේ. සිංහල නොදන්නා පුද්ගලයෙකු අන් මොනයම් ක්‍රමයකින්වත් සිංහලයෙකු වන්නේ කෙසේදැයි මට නම් නොතේරේ. ඒ නිසාම සිංහල අප "සිංහල දරුවන්" වැදුවේ නම් (පමණක්) ඒ බව ඔවුන්ටත්, අනුන්ටත් දැනීමට නම්, ඔවුන් සිංහල භාෂාව උගත යුතුමය.

අප ඒ සඳහා උපක්‍රම, පහසුකම් සාදා ගත යුතුය. ලෙබනන් හෝ චීන හෝ ඉතාලි ජාතිකයින් අප ඒ දේ කර දෙන්නේ නැත. ඒ සඳහා අපම වෙහෙසිය යුතුය, කැපවිය යුතුය, උදව් කළ යුතුය. අපේ දරුවන් අප නැති කලෙක අප කල ඒ දේ අගය කරනු නොඅනුමානය. නොකලොත්, තනි වූ බව දැනුනු දිනෙක ඔවුන් අපට දෙස් දෙවොල් තබන බවත් නොඅනුමානය.

දුර දක්නා නුවණ තිබූ අපේ සොයුරු සොයුරියන් කීප දෙනෙක් එක් වී ඇති කළ නිව් සවුත් වේල්සයේ සිංහල සංස්කෘතික හමුව (www.thescf.org.au) මේ යුතුකම ඉටුකිරීමට උත්සහ කර ඇතැයි මට හැඟේ. සති අන්තයේ අපේ දරුවන්ට සිංහල භාෂාව ඉගැන්වීමේ පාසල් කීපයක්ම සිඩ්නි නුවර ආශ්‍රිතවත් (North Parramatta, Blactown, Minto), එමෙන්ම New Castle වැනි දුර බැහැරත් පවත්වාගෙන යාම ගැන අපි ඔවුන්ට ස්තුතිවන්ත විය යුතු වෙමු. වික්ටෝරියා වැනි අනෙක් ප්‍රාන්ත වලත් මෙවන් පාසල් ඇතැයි මම අසා ඇත්තෙමි.

ෆෙඩරල් මෙන්ම ප්‍රාන්ත ආණ්ඩු වලින්ද මේ සඳහා අනුග්‍රහ ලැබීමෙන්ම එම කටයුත්තේ ඇති නිවැරදි අවශ්‍යතාව අපට හොඳින් දැනේ. එහෙත් එය අපේම සමහර දෙමව්පියන්ට නොදැනෙන්නේ ඇයි දැයි මට නම් නොතේරේ. සමහර විට ඔවුන් වදන්නට ඇත්තේ සුද්දන් වන්නට ඇත. ඊට හේතු සාධක විය හැකි ජීව විද්‍යාත්මක කරුණු මෙහි කථා කරන්නට මම අකැමැත්තෙමි. මගේ තර්කයේ හැටියට නම් දෙමළ භාෂාව භාවිතා කරන කළු ඕස්ට්‍රේලියානුවන් දෙමළ සම්භවයකිනුත්, සිංහල භාෂාව භාවිතා කරන කළු ඕස්ට්‍රේලියානුවන් සිංහල සම්භාවයකිනුත්, හින්දි භාෂාව භාවිතා කරන කළු ඕස්ට්‍රේලියානුවන් උතුරු ඉන්දීය සම්භාවයකිනුත් මෙන්ම, ඉංග්‍රීසි භාවිතා කරන කළු

41 වන පිටට